# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 879 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 24/05/2024 පැය 0540

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - රාගම පොලිස් වසම.

2024.05.23 වන දින අළුයම් කාලයේ රාගම පොලිස් වසමේ නාරංගොඩපාළුව ප්‍රදේශයදී තියුණු ආයුධයකින් පහරදී පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට රාගම පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 42 ක් වූ නාරංගොඩපාළුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරුගේ බිරිඳ අනියම් සබඳතාවයක් පවත්වාගෙන ගොස් ඇති බවත් එම පුද්ගලයා මරණකරුගේ නිවසට පැමිණ අතිකරගත් ආරවුලක් දුරදිග යාමෙන් අනියම් සැමියා විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට විමර්ශනයේදි අනාවරණය වි ඇත.

සැකකරු හා මෙම ඝාතනයට ආධාර අනුබලදීම සම්බන්ධයෙන් මරණකරුගේ බිරිඳ අත්අඩංගුවට ගෙන ඇත. රාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට තැත්කිරීම සම්බන්ධයෙන් ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - අහුන්ගල්ල පොලිස් ස්ථානය.

2024.05.08 වන දින අහුන්ගල්ල පොලිස් වසමේදී වෙඩිතබා පුද්ගලයෙකු ඝාතනය කිරීමට තැත් කිරීමේ අපරාධයක් සම්බන්ධයෙන් අහුන්ගල්ල පොලිස් ස්ථානය මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි. ඒ අනුව මෙම අපරාධයට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් අවශකර සිටි සැකකරුවෙකු 2024.05.23 වන දින ඌරගස්මංහන්දිය ප්‍රදේශයේදී අහුන්ගල්ල පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ සැකකරු සන්තකයේ තිබි හෙරොයින් ග්‍රෑම් 4 ක් ද පොලිසිය විසින් සොයාගෙන ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන ඌරගස්මංහන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු මෙම වෙඩිතැබීම සඳහා ඔත්තු බැලීම සිදුකර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර අහුන්ගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. සැකකටයුතු ලෙස පුද්ගලයින් දෙදෙනෙකු මියයාම - පුපුරැස්ස පොලිස් වසම.

2024.05.23 වන දින අළුයම් කාලයේ පුපරැස්ස පොලිස් වසමේ පුපුරැස්ස බස් නැවතුම්පල ආසන්නයේ මැහුම් හලක් තුල නිදාගෙන සිටි පියකු හා පුතෙකු මියගොස් ඇති බවට පුපුරැස්ස පොලිස් ස්ථානයට ලද තොරතුරක් අනුව පුපුරැස්ස පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මෙලෙස මියගොස් ඇත්තේ නැඩ්සා ජනපදය, පුපුරැස්ස ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 40 ක් වූ පියෙකු හා වසර 17 ක් වන ඔහුගේ පුත්‍රයා වේ.**

මියගිය පුද්ගලයන් දෙදෙනා 2024.05.23 වන දින පැවැත්විමට නියමිතව තිබූ දන්සැලක සංවිධාන කටයුතු සඳහා සහභාගී වී මධ්‍යම රාත්‍රියේදී නගරයේ මැහුම්හලක නිදාගෙන ඇති අතර එම මැහුම්හල තුල තිබූ විදුලි ජනක යන්ත්‍රය අක්‍රීය වීමහේතුවෙන් ඉන්ධන දැමීමට පැමිණි පුද්ගලයෙකු මොවුන් දෙදෙනා මියගොස් සිටින අයුරු දැක ඇති බවට විමර්ශනයේදි අනාවරණය වි ඇත. පුපුරැස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. ගසක අත්තක් කඩාවැටී එයට යටවීමෙන් පුද්ගලයෙකු මියයාම - රාගල පොලිස් වසම.

2024.05.23 වන දින උදෑසන කාලයේ රාගල පොලිස් වසමේ මහකුඩුගල රක්ෂිත ප්‍රදේශයේදී අයහපත් කාලගුණ තත්වය හේතුවෙන් ගසක අත්තක් කඩා වැටී එයට යටවීමෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට රාගල පොලිස් ස්ථානයට ලද තොරතුරක් අනුව ඉමදූව පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ හයිෆොරස්ට් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මියගිය පුද්ගලයා තවත් පුද්ගලයින් සිව්දෙනෙකු සමඟ දර එකතු කිරිමට ගොස් සිටියදී මෙම අනතුරට ලක්ව ඇති බවට විමර්ශනයේදි අනාවරණය වි ඇත. මෘත ශරීරය නුවරඑළිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර රාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාලිගාවත්ත පොලිස් ස්ථානය.

2024.05.23 වන දින සවස් කාලයේ මාලිගාවත්ත පොලිස් වසමේ මාලිගාවත්ත මහල් නිවාස, කොළඹ 10 ප්‍රදේයේදී මාලිගාවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම්12 මිලිග්‍රෑම් 440 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මාලිගාවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.

2024.05.23 වන දින උදෑසන කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ 72 වත්ත ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත

වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 130 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - කඳාන පොලිස් ස්ථානය.**

2024.05.23 වන දින සවස් කාලයේ කඳාන පොලිස් වසමේ වැලිගම්පිටිය හංදිය අසලදී කඳාන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 500 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 47 ක් වන වැලිසර ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

කඳාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. වන අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියයාම - මහඔය පොලිස් වසම**

2024.05.23 වන දින උදෑසන කාලයේ මහඔය පොලිස් වසමේ මාදුරු ඔය රක්ෂිත ප්‍රදේශයේදී වන අලියෙකු පහරදීම හේතුවෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට ලද තොරතුරක් මත මහඔය පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.

මහඔය පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**09. මාරක රිය අනතුරක් - හංවැල්ල පොලිස් වසම.**

2024.05.23 වන දින අළුයම් කාලයේදී හංවැල්ල පොලිස් වසමේ පාදුක්ක වග මාර්ගයේ දී වග දෙස සිට පාදුක්ක දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා වැටී තිබූ ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පැදිකරු පාදුක්ක රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක්වූ තුම්මෝදර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය පාදුක්ක රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හංවැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. මාරක රිය අනතුරක් - ඊච්චලම්පත්තු පොලිස් වසම.**

2024.05.23 වන දින අළුයම් කාලයේදී ඊච්චලම්පත්තු පොලිස් වසමේ ත්‍රිකුණාමලය මඩකලපුව මාර්ගයේ දී සේරුනුවර දෙස සිට වෙරුගල් දෙසට ධාවනය වූ මෝටර් රථයක් රියදුරුට නින්දයාම හේතුවෙන් මාර්ගයෙන් ඉවතට පැන පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුර සිදුවන අවස්ථාවේ මෝටර් රථයේ රියදුරුගේ පවුලේ සාමාජිකයින් සිට ඇති අතර අනතුරින් තුවාල ලැබූ ඔහුගේ දරුවන් දෙදෙනා ඊච්චලම්පත්තු රෝහලට ඇතුලත් කර ඇති අතර එක් දරුවෙකු මුතූර් රෝහල වෙත වැඩිදුර ප්‍රතිකාර සඳහා මාරුකර යවා ඇති අතර එහිදී එම දරුවා මියගොස් ඇත.

**මියගිය දරුවා වයස අවුරුදු 06 ක්වූ ජේදුරුතුඩුව ප්‍රදේශයේ පදිංචිව සිට ඇත.**

මෘත ශරීරය මුතුර් රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ඊච්චලම්පත්තු පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - සීදූව පොලිස් වසම.

2024.05.23 වන දින සවස් කාලයේදී සීදූව පොලිස් වසමේ මීගමුව කොළඹ මාර්ගයේ ලියනගේමුල්ල ප්‍රදේශයේදීමීගමුව දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා ගමන්ගත් පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා විජය කුමාරතුංග රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 65ක් වූ කටාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය විජය කුමාරතුංග රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අනතුර සම්බන්ධයෙන් යතුරුපැදිකරු අත්අඩංගුවට ගෙන ඇත. සීදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**